**කුඩාපරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන - 2018**

-----------------------------------------------------------------

කුඩාපරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන - 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස 18 ක කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2017 ජුනි 26 දින එළඹි අංක 2000001843 හා 2017 නොවැම්බර් 21 දින එළඹි අංක 2000001984 දරන ණය ගිවිසුමේ IX වන ව්‍යාස්ථාවේ 9.03 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, ජනාධිපති කාර්යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. වෙළඳපොල අභිමුඛ නිෂ්පාදන සහ අලෙවි පද්ධතිය හා සම්බන්ධ කුඩාපරිමාණ ඉඩම් හිමියන් 57, 500 කගේ ආදායම තිරසර ලෙස ඉහළ නැංවීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 17,172.42 කට සමාන එජඩො මිලියන 105.04 ක් වන අතර ඉන් රු. මිලියන 8,893.58 කට සමාන එජඩො මිලියන 54.40 ක් මූල්‍යයනය කිරීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල එකඟවී තිබුණි. රු. මිලියන 3,164.86 ක් වූ ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මඟින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහන එහි කටයුතු 2017 ජුනි 26 දින ආරම්භ කර තිබුණු අතර, 2023 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 මතය

-------

වැඩසටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 18 ක කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික ප්‍රගතිය

-------------------

## 2.1 වැඩසටහන් ක්‍රියාකාරකම්හි භෞතික ප්‍රගතිය

-----------------------------------------------

වාණිජ සහභාගීත්වය සඳහා ප්‍රවේශය, ග්‍රාමීය මූල්‍ය සහ වැඩසටහන් කළමනාකරණය හා ප්‍රතිපත්ති සංවාද යන සංරචක 03 යටතේ වැඩසටහනේ ක්‍රියකාරකම් ක්‍රියාත්මක වේ.

| | සංරචකය | විගණන ගැටළුව | බලපෑම | ප්‍රමාදවීම් සඳහා හේතු | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ------------ | -------------------- | ------------ | ---------------- | --------------------- |
| (අ) | වාණිජ සහභාගීත්වය සඳහා ප්‍රවේශය හා ග්‍රාමීය මූල්‍ය | 2017 ජූලි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා මාස 18 ක කාලසීමාව තුළ කුඩාපරිමාණ ඉඩම් හිමියන් ද ඇතුළත්ව ප්‍රතිලාභීන් 45,000 කට උප ණය ලබා දීමට ඉලක්ක කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව, 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 13,887 ක් හඳුනාගෙන තිබුණි. ඉන් ප්‍රතිලාභීන් 2,119 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කර තිබුණු අතර එදිනට ප්‍රතිලාභීන් 1,715 ක් සඳහා රු. මිලියන 320.13 ක උප ණය ප්‍රදානය කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නොහැකි වනු ඇත. | රාජ්‍ය - පෞද්ගලික - නිෂ්පාදක හවුල්කාරීත්ව ගිවිසුම් 09 කට ඇතුළත් වී ගොවීන් 13,887 ක් සමඟ ඉදිරි වර්ෂ 02 ක් ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කර ඇත. | ඉලක්ක ලඟාකර ගැනීමට හැකි වන පරිදි වැඩසටහනේ ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වීම. |
| (ආ) | වැඩසටහන් කළමනාකරණය හා ප්‍රතිපත්ති සංවාද | ප්‍රවර්ධක සමාගම් විසින් 2018 දෙසැම්බර් 31 දිනට කුඩාපරිමාණ තේ වගාකරුවන්ට සහායවීම සඳහා පුහුණුවීම් පවත්වා නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර ඇති ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට නොහැකි වනු ඇත. | ව්‍යාපෘතියේ හවුල්කරුවන්, ප්‍රවර්ධක සමාගම සහ ප්‍රවර්ධක බැංකුවෙහි අඩුපාඩු වූ අතර එම නිසා ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් පරීක්ෂා කිරීම සඳහා වටිනාකම් දාම සජීවීකාරක තනතුර සඳහා පුද්ගලයෙකු පත් කර ඇත. | ප්‍රවර්ධක සමාගම සහ බැංකු විසින් සිදු කරන ක්‍රියාකාරකම් සම්බන්ධව සමීප සුපරීක්ෂණයක් අවශ්‍ය වීම. |

## 2.2 ක්ෂේත්‍ර පරීක්ෂාවේදී සිදුකළ නිරීක්ෂණ

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| අංකය | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අවශ්‍ය පුහුණුවීම්, යටිතල පහසුකම්, තාක්ෂණික දැනුම සහ අනෙකුත් සහායවීම් නොමැතිවීම හේතුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩාපරිමාණ තේ වගාකරුවන්, තේ පැළ තවාන් සැකසීමට හා පවත්වාගෙන යාමට සම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම. | ගොවියන් විසින් සම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීමට බලපෑම් කළ හැකි වේ. | ව්‍යාපෘතියේ හවුල්කරුවන්, ප්‍රවර්ධක සමාගම සහ ප්‍රවර්ධක බැංකුවෙහි අඩුපාඩු විය. එම නිසා ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන් පරීක්ෂා කිරීම සඳහා වටිනාකම් දාම සජීවීකාරක තනතුර සඳහා පුද්ගලයෙකු පත් කර ඇත. | ප්‍රවර්ධක සමාගම සහ බැංකු විසින් සිදු කරන ක්‍රියකාරකම් සම්බන්ධව සමීප සුපරීක්ෂණයක් අවශ්‍ය වේ. |
| (ආ) | ගාල්ල දිස්ත්‍රික්කයේ තේ වගාකරුවන් කුඩාපරිමාණ කෘෂිව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා වගාකරුවන්ගේ සමිති / කණ්ඩායම් ඇතිකිරීමට යොමුකර නොතිබුණි. | අදාල පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය දුර්වල වීම. | දුර්වලතා අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා හඳුනාගන්නා ලද ගැටළු සමාගම සහ බැංකුව වෙත සන්නිවේදනය කරන ලදී. | -එම- |
| (ඇ) | කුඩාපරිමාණ වගාකරුවන් 537 ක් විසින් තේ පැළ නැවත සිටුවීම හා පාළු සිටුවීම සඳහා වූ පිරිවැය සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රවර්ධක සමාගම විසින් දායකත්වයක් ලබා දී නොතිබුණි. | වගාකරුවන් අධෛර්යමත් විය හැකි වීම. | දුර්වලතා අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා හඳුනාගන්නා ලද ගැටළු සමාගම සහ බැංකුව වෙත සන්නිවේදනය කරන ලදී. | -එම- |
| (ඈ) | කුරුණෑගල ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති ප්‍රවර්ධක බැංකුවේ ශාඛාවක් විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ වගාකරුවන් ප්‍රවර්ධනය | වගාකරුවන් අධෛර්යමත් විය හැකි වීම. | ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කිරීමේ ලිපියක් සහ බැංකු ප්‍රකාශන නිකුත් කිරීම පිළිබඳ දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම සඳහා සේවා සැපයීමට යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. බැංකු ගිණුම මඟින් සිදු කළ ගනුදෙනුවල තොරතුරු සැපයීම සඳහා අදාල ප්‍රවර්ධක බැංකුව විසින් වගාකරුවන් වෙත බැංකු පොතක් නිකුත් තර නොතිබුණි. | | | |
| (ඉ) | ප්‍රගති වාර්තා අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ මල් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 15.3 ක් වටිනා උප ණය ලබාගැනීමට ප්‍රතිලාභීන් 153 ක් අයදුම් කර තිබුණි. ඉන් 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රතිලාභීන් 66 කට රු. මිලියන 6.6 ක් වටිනා උප ණය නිදහස් කර තිබුණි. | වෙන්කරන ලද ප්‍රතිපාදන ඌනඋපයෝජනය විය හැකි වීම. | භාවිතා කරන අමුද්‍රව්‍යවල පිරිවැය හේතුවෙන් යෝජිත පැළැටි මඩුව එම මිල යටතේ ඉදි කළ නොහැකි වීම. | ප්‍රතිලාභීන්, ප්‍රවර්ධක සමාගම් සහ බැංකු මුහුණපාන ගැටළු සමාලෝචනය කළ යුතු වීම. |
| (ඊ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් මල් වගා ව්‍යාපාරයේ නියුතු පැළැටි මඩුව ඉදි කිරීම සඳහා ලබාදුන් ප්‍රදාන මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදවා ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වෙන්කරන ලද ප්‍රතිපාදන අවභාවිතා විය හැකි වීම. | අරමුදල් උපයෝජනය සහ ණය අයවීම් සමීපව සුපරික්ෂා කරන ලෙස බැංකුවට සහ සමාගමට දැනුම් දෙනු ලැබේ. | අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. |